# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2132/7 – 2019 ජූලි 17 වැනි බදාදා – 2019.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 130 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2018/UDA/178.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: BD/HP/LND 2/LAQ/01.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජූලි මස 08 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැඳුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, හපුතලේ.

2. **ඉඩමේ විස්තරය.–** ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහපළාත කෝරලේ සුළු කොට්ඨාසයේ, හපුතලේ (63 ඒ) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හපුතලේ (න.මැ.මු.පි. 61) (හපුතලේ නගර සභා සීමාව තුළ) (කොට්ඨාස අංක 01) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක B/ACQ/HPT/2018/764 හා 2019.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ෂර්වුඩ් ඩිව්ෂන් – ප්‍රමාණය: හෙක්. 0.0565ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ සිමෙන්ති කාණුව; නැගෙනහිරට: සිමෙන්ති කාණුව සහ ෂර්වුඩ් ඩිව්ෂන් නැමැති ඉඩමේ ඉතිරි කොටස; දකුණට: ෂර්වුඩ් ඩිව්ෂන් නැමැති ඉඩමේ ඉතිරි කොටස සහ රාධා ක්‍රිෂ්ණන් හිමිකම් කියන ඉඩම; බටහිරට: රාධා ක්‍රිෂ්ණන් හිමිකම් කියන ඉඩම සහ මාර්ගය (මා.සං.අ.).

08 - 27